# රාජ්‍ය භාෂා ප්‍රවීණතා වාචික පරීක්ෂණය

## හැඳින්වීම

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම යටතේ නිකුත් කර ඇති 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි 2.1 ඡේදය අනුව රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ නිලධරයන්ට අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා රාජ්‍ය භාෂා පුහුණු පාඨමාලාවකට සහභාගී විය යුතු බවට විධිවිධාන දක්වා තිබුණි. එහෙත් එම චක්‍රලේඛයට සංශෝධන වශයෙන් 2025.05.26 දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020(II) මගින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි 2.1 ඡේදයේ සඳහන් සුදුසුකම්වලට අමතරව අ.පො.ස.(සා/පෙළ) දෙවන බස සිංහල/දෙමළ විෂයය සමත්වීම සමඟ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි 2.1 ඡේදයේ සඳහන් කාණ්ඩවලට අනුරූපී මට්ටම අනුව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකට පෙනී සිට ඉන් සමත් වීම මගින් ද අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා අවශ්‍යතාව සපුරා ගැනීමට අවස්ථාව හිමි වන බව දක්වා ඇත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020(II) හි විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීමට අදාළ වාචික පරීක්ෂණය පැවැත්වෙන ආකාරය හා ඒ සම්බන්ධ විධිවිධාන ඇතුළත් කරමින් 2026.04.08 දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 01/2026 හි සඳහන් පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතා වාචික පරීක්ෂණය පැවැත්වීමට කටයුතු යොදා ඇත.

වාචික පරීක්ෂණය, ශ්‍රවණ කුසලතා ඇගයීම සහ කථන හා කියවීමේ කුසලතා ඇගයීම වශයෙන් කොටස් 02කින් සමන්විත වේ. ශ්‍රවණ කුසලතා ඇගයීම සමත් අයදුම්කරුවන්ට පමණක් කථන හා කියවීමේ කුසලතා ඇගයීමට අවස්ථාව ලබා දෙනු ලැබේ. විභාගය සමත්වීම සඳහා එම කොටස් දෙකට ම වෙන් වෙන් වශයෙන් ලකුණු 40%කට නොඅඩුව ලබා ගත යුතු ය.

## රාජ්‍ය භාෂා ප්‍රවීණතා වාචික පරීක්ෂණය සඳහා ඉල්ලුම් කිරීමට සපුරාගත යුතු සුදුසුකම්

අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා වාචික පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අපේක්ෂිත නිලධාරින් ලිඛිත සුදුසුකම ලෙස අ.පො.ස.(සා/පෙළ) දෙවන බස සිංහල/දෙමළ විෂයය සමත් ව තිබිය යුතු ය.

මෙම වාචික පරීක්ෂණයට අයදුම් කරන අවස්ථාව වන විට, ඉහත සඳහන් ලිඛිත සුදුසුකම සපුරා තිබිය යුතු අතර ඒ බව සනාථ කිරීමට අදාළ සහතිකය ශ්‍රවණ කුසලතා ඇගයීම් පරීක්ෂණයට පැමිණීමේ දී අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතු වේ.

## විභාගයට අයදුම් කිරීම

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ www.languagesdept.gov.lk වෙබ් අඩවිය ඔස්සේ මාර්ගගත ක්‍රමයට පමණක් මෙම වාචික පරීක්ෂණයට අයදුම් කළ යුතු අතර වසරේ ඕනෑම දිනක මෙම අයදුම්පත් ඉදිරිපත් කළ හැකි ය. මෙම වාචික පරීක්ෂණයට අයදුම්පත්‍ර කැඳවීම සඳහා ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීමක් සිදු නොවේ.

විභාග අයදුම්කරුවන් විභාගයට අයදුම් කළ යුත්තේ තමාට අදාළ සේවා මට්ටමට නියමිත අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා මට්ටම සඳහා පමණි. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි 2.1 ඡේදයෙහි දක්වා ඇති පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025හි සේවා මට්ටම් වර්ගීකරණය අනුව තමාට නියමිත මට්ටම තීරණය කර ගත යුතුය.

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට පිවිස විමසා ඇති කරුණු සඳහා අයදුම්කරුවන් විසින් වලංගු දත්ත ඇතුළත් කළ යුතු අතර විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවෙකු නම්, ඒ පිළිබඳ විස්තර අයදුම්පත්‍රයෙහි සඳහන් කළ යුතු ය. අයදුම්පත්‍රය ඉංග්‍රීසි භාෂාවෙන් පළවන අතර, එය ඉංග්‍රීසි භාෂාවෙන් ම සම්පූර්ණ කළ යුතු වේ.

වාචික පරීක්ෂණය සඳහා අයදුම් කරන සෑම නිලධරයෙකු ම විභාග ගාස්තුවක් ගෙවිය යුතු ය. එක් එක් මට්ටමට අදාළ විභාග ගාස්තු පහත පරිදි වේ.

| **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව සේවා මට්ටම (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව සේවා මට්ටම)** | **අදාළ වන කාණ්ඩය** | **අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා වාචික පරීක්ෂණ මට්ටම** | **ගාස්තුව (රු.)** |
|---|---|---|---|
| තෘතියික/ජ්‍යෙෂ්ඨ | 1 | I මට්ටම | රු: 2000.00 |
| ද්විතීයික | 2 | II මට්ටම | රු: 1500.00 |
| ප්‍රාථමික | 3 | III මට්ටම | රු: 1000.00 |

විභාග ගාස්තුව දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් " රාජගිරිය, ලංකා බැංකුවේ රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්ගේ අංක 7041541 දරන ගිණුමට" බැර කළ යුතු අතර, මුදල් ගෙවීමේදී භාවිත කරන බැංකුවට අදාළ පෝරමයේ තැන්පත්කරුගේ නම සහ ලිපිනය සඳහන් කිරීමට ඇති ස්ථානයේ නම සහ ලිපිනයට අමතරව තැන්පත්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය සමඟ "Oral Exam" යන්න ද සඳහන් කළ යුතු ය. මුදල් ගෙවීමෙන් පසුව බැංකුව විසින් ලබා දෙන ලදුපතෙහි පරිගණකය ආශ්‍රිතව මුද්‍රිත වී ඇති අංකය (කොටස් හතරකින් යුත්) හා දිනය, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ඇති අයදුම්පතේ අදාළ කොටුව තුළ සඳහන් කළ යුතු ය.

අදාළ මුදල ගෙවූ බව සහතික කර ගැනීම සඳහා බැංකු රිසිට්පත ශ්‍රවණ කුසලතා ඇගයීම් පරීක්ෂණයට පැමිණීමේ දී අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතු වේ. විභාග ගාස්තුව වශයෙන් ගෙවන ලද මුදල් කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

## විභාගය පැවැත්වීම හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට අදාළ කොන්දේසි

මෙම විභාගය සෑම වසරක ම දෙවරක් පවත්වනු ලැබේ. එහෙත් ලැබෙන ඉල්ලුම්පත් සංඛ්‍යාව මත ඊට වැඩි වාර ගණනක් විභාගය පැවැත්වීම පිළිබඳ රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් තීරණය කරනු ලබයි. එසේම විභාග පැවැත්වෙන දින පිළිබඳව ඒ ඒ විභාගයට මසකට පෙර අයදුම්කරුවන් වෙත දැනුම් දීමට කටයුතු කරනු ඇත.

සියලු ම මට්ටම්වලට අදාළ ශ්‍රවණ කුසලතා ඇගයීමේ පරීක්ෂණ රාජගිරිය, කෝට්ටේ පාර, 341/7 හි පිහිටි රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දී පමණක් පවත්වනු ඇත. කථන කුසලතා ඇගයීම් පරීක්ෂණයට අදාළ අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව සලකා, දිස්ත්‍රික්ක / පළාත් මට්ටමින් හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දී පවත්වනු ඇත.

විභාග අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

විභාග අපේක්ෂකයන් වෙත නිකුත් කරන විභාග ප්‍රවේශ පත්‍රයේ ඔහු හෝ ඇය සේවය කරන ආයතනයේ ආයතන ප්‍රධානියා වෙතින් තම අත්සන සහතික කරවා ගත යුතු ය.

විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ ජාතික හැඳුනුම්පත, වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය පමණි. අනන්‍යතාව තහවුරු කිරීමට අදාළ එම ලේඛන ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ට විභාගය සඳහා ඉදිරිපත් වීමට අවස්ථාවක් නොමැත.

විභාග ප්‍රතිඵල ඒ ඒ අපේක්ෂකයන් වෙත පෞද්ගලිකව දන්වනු ලබන අතර, එය රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ ද පළ කරනු ලැබේ. මෙම විභාග ප්‍රතිඵල නැවත සමීක්ෂණය සිදු නොකරන අතර විභාගය පැවැත්වීම හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීම ඇතුළුව වාචික පරීක්ෂණ සම්බන්ධයෙන් වන සියලු කරුණු සහ එම කරුණුවලට අමතරව පැන නඟින ඕනෑම කරුණක් සම්බන්ධව අවසාන තීරණය අදාළ පරිදි රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් සතු ය.

විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

මෙම වාචික පරීක්ෂණයට අදාළ කරුණු පිළිබඳව යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම් 0112889506 / 0112865428 අංක ඔස්සේ විභාග අංශය ඇමතිය හැකි ය.